ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුලි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව එකතු කරන ලද ආදායම රු.16,047,868ක් වුවද අග්‍රිම ගැළපුම් ප්‍රකාශනයෙහි සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි එය රු.16,043,318ක් වශයෙන් රු.4,550ක් අඩුවෙන්ද, දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් රු.1,108,546ක් වුවද අග්‍රිම ගැළපුම් ප්‍රකාශනයෙහි එය රු.1,113,096ක් වශයෙන් රු.4,550ක් වැඩියෙන් ද සටහන් කර තිබුණි.	රු.4,550ක වෙනස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් අතිරේකව ලද මුදලක් වන බවත්, මේ වනවිට එය නිවැරදි කිරීමට කටයුතු කර ඇති බවත් දන්වා තිබුණි.	නිවැරදි ශේෂ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතු වීම.

(ආ) පුනරාවර්තන වියදම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	204-2-1-0-1003 වැය විෂයයෙහි දෙපාර්තමේන්තු පොත් අනුව මුළු වියදම රු.44,710,564ක් වුවද එය රු.44,803,464ක් ලෙස ඒසීඒ 2 (ii) වියදම් ප්‍රකාශනයෙහි සටහන් කිරීම හේතුවෙන් රු.92,900ක වෙනසක් ද, එම වැය විෂයය සඳහා දෙපාර්තමේන්තු පොත් අනුව ඉතිරිය රු.2,007,435ක් වුවද	අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තු පොත්වල නිවැරදි සංඛ්‍යාවන් ඇතුළත් කළ යුතු වීම.

	ඒසීඒ 2 (ii) හි රු.1,914,535ක් වශයෙන් සඳහන් කිරීම හේතුවෙන් රු.92,900ක වෙනසක් ද පැවතුණි.		
(ii)	204-2-1-0-1409-104 වැය විෂයයෙහි දෙපාර්තමේන්තු පොත් අනුව මුළු වියදම රු.3,871,351ක් වුවද එය රු.4,481,266ක් ලෙස ඒසීඒ 2 (ii) වියදම් ප්‍රකාශනයෙහි සටහන් කිරීම හේතුවෙන් රු.609,915ක වෙනසක් ද, එම වැය විෂයය සඳහා දෙපාර්තමේන්තු පොත් අනුව ඉතිරිය රු.3,128,648 ක් වුවද ඒසීඒ 2 (ii) හි රු. 2,518,733 ක් වශයෙන් සඳහන් කිරීම හේතුවෙන් රු.609,915 ක වෙනසක් ද පැවතුණි.	අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තු පොත්වල නිවැරදි සංඛ්‍යාවන් ඇතුළත් කළ යුතු වීම.
(iii)	වැය විෂයය 204-2-1-0-1203-002 යටතේ දෙපාර්තමේන්තු පොත් අනුව ඉතිරිය රු.58,000ක් වුවද ඒසීඒ 2 (ii) වියදම් ප්‍රකාශනයෙහි රු.64,000ක් වශයෙන් සඳහන් කිරීම හේතුවෙන් රු.6,000ක වෙනසක් පැවතුණි.	අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තු පොත්වල නිවැරදි සංඛ්‍යාවන් ඇතුළත් කළ යුතු වීම.
(iv)	වැය විෂයය 204-2-1-0-1409-140 යටතේ දෙපාර්තමේන්තු පොත් අනුව ඉතිරිය රු.1,230,555ක් වුවද ඒසීඒ 2 (ii) වියදම් ප්‍රකාශනයෙහි රු.1,320,555 ක් වශයෙන් සඳහන් කිරීම හේතුවෙන් රු.90,000ක වෙනසක් පැවතුණි.	අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තු පොත්වල නිවැරදි සංඛ්‍යාවන් ඇතුළත් කළ යුතු වීම.
(v)	අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ**,** අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම් රු.539,863ක් අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් “බී” ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් ලෙස සඳහන් කර තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

(ඈ) තැන්පතු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
6000-0-0-1-120 දරන ඇප තැන්පතු ලේඛනයේ සමාලෝචිත වර්ෂය අවසානයේ ශේෂයක් සඳහන්ව නොතිබුණද ඒසීඒ 4හි රු.42,420 ක ශේෂයක් දක්වා තිබුණි.	අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි.	තැන්පතු ලෙජර යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම.

(ඈ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පෙර වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ 6හි මුල්‍ය නොවන වත්කම්වල වර්ෂය අවසාන ශේෂය රු.159,099,465ක් වුවද සමාලෝචිත වර්ෂයේ ඒසීඒ 6හි ආරම්භක ශේෂය රු.161,124,465ක් වශයෙන් සඳහන්ව තිබූ අතර වෙනස රු.2,025,000ක් විය.	රු.2,025,000ක වෙනස මෝටර් රථය හුවමාරුව සහ ත්‍රිරෝද රථය අපහරණය ඇතුළත් කිරීම හේතුවෙන් ඇතිවී ඇති බවත්, පිළිවෙලින් රු.2,200,000ක් සහ රු.175,000ක් 2023 වර්ෂයේ ආරම්භක ශේෂයට ගැලපීම් කර ඇති බැවින් එය 2024 වර්ෂයේ ශුද්ධ ශේෂයට බලපෑමක් ඇති නොකරන බවත් දන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප විය යුතු වීම.

(ඉ) අත්තිකාරම් ගිණුම් ශේෂ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තු ණයගැති/ණයහිමි පාලන ගිණුම අනුව සමාලෝචිත වර්ෂය තුළ මුදලින් බැරකිරීම් රු.4,846,846ක් වුවද, අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ඒසීඒ 5) හි රු.847,470ක් වශයෙන් රු.3,999,376ක් අඩුවෙන්ද, වර්ෂය තුළ හරස් සටහන් මඟින් බැරකිරීම් රු.1,384,133 ක් වුවද ඒසීඒ 5හි රු.5,383,509ක් වශයෙන් රු.3,999,376ක් වැඩියෙන්ද සටහන් කර තිබුණි	අත්තිකාරම් ගිණුම් කේතය 8493-0-0-204-0-11-09(බැර) රු.4,846,846.41ක මුදල ,මුදල් සහ හරස් සටහන් ලෙස පිළිවෙලින් රු.847,470ක් සහ රු.3,999,376.41කින් සමන්විත වේ. කෙසේ වෙතත්, එය භාණ්ඩාගාර මුද්‍රිතයේ වෙනම දක්වා නොමැති බව දන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි සංඛ්‍යා ඇතුළත් කළ යුතු වීම.

(ඊ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) බැරකම් පිළිබඳ ලේඛනය		
මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය.
(ii) තැන්පතු ලෙජරය		
මුදල් රෙගුලාසි 592 ප්‍රකාරව තැන්පතු ලෙජරය යාවත්කාලින කර නොතිබුණි.	යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 592 ප්‍රකාරව තැන්පතු ලෙජරය යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කල යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරික්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරික්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
පෙර වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ 6හි මූල්‍ය නොවන වත්කම්වල වර්ෂය අවසාන ශේෂය රු.159,099,465ක් වුවද සමාලෝචිත වර්ෂයේ ඒසීඒ 6හි ආරම්භක ශේෂය රු.161,124,465ක් වශයෙන් සඳහන්ව තිබීම හේතුවෙන් රු.2,025,000ක වෙනසක් පැවතුණි.	1.6.1 (ඇ)

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයයන් හත(07) ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.15,450,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.7,577,284ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 32 සිට සියයට 88 දක්වා පරාසයක් ගෙන තිබුණි.	අවශ්‍යතා මතු නොවීම සහ ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව වියදම් පාලනය කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි.	වෙන් කර ගනු ලැබූ ප්‍රතිපාදන අදාළ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතු වීම.
(ආ)	එක් මූලධන වැය විෂයයක් සඳහා රු.1,000,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.474,200ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 47 ක් විය.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව වියදම් පාලනය කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි.	ඇස්තමේන්තු සකස් කිරීමේදී අනිවාර්ය පුහුණු කිරීම් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කර ගත යුතු වීම.
(ඇ)	එක් පුනරාවර්තන වැය විෂයයක් සඳහා රු.500,000 ක හා එක් මූලධන වැය විෂයයක් සඳහා රු.1,000,000ක ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන් කර ගෙන තිබුණද සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව වියදම් පාලනය කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි.	වෙන් කර ගනු ලැබූ ප්‍රතිපාදන අදාළ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතු වීම.
(ඇ)	පුනරාවර්තන වැය විෂයයන් දෙකක් (02) සඳහා එකතුව රු.550,000 ක් වූ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර ගෙන තිබුණද, මාරු කරන ලද සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව වියදම් පාලනය කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි.	අත්‍යාවශ්‍ය වියදම් දැරීම සඳහා වෙන් කර ගනු ලැබූ ප්‍රතිපාදන අදාළ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතු වීම.

3.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණනය කරනු ලබන ආස්ථිතයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.	අදාළ වාර්තා නිසි පරිදි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**				
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.5 ඡේදය	-	මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර නොතිබුණි.	අනුමත කාර්ය මණ්ඩලයේ SLAS (111) සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා පුරප්පාඩු තුනක් පැවති බැවින්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් නොසිටීම හේතුවෙන් වර්තමානයේ සිටින නිලධාරීන් විසින් මානව සම්පත් සැලැස්ම ක්‍රියාත්මක කරන ලද බව දන්වා තිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව අදාළ පත්වීම් සිදු කළ යුතු වීම.
(ආ)	**රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ** 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන	-	සියළුම වාර්තාකරණ ආයතන විසින් තැන්පතු සඳහා සැසඳීම් ප්‍රකාශනය පිළියෙළ කර 2025 පෙබරවාරි 28 දින	ලබන වසරේ සිට තැන්පතු සැසඳීම නියමිත වේලාවට සකස් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වීම.

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.3 ජේදය	හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද අදාළ සැසඳීම් ප්‍රකාශනය 2025 මැයි 09 දින ඉදිරිපත් කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතු වුවත් 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව**,** මාස 08ක ප්‍රමාදයකින් පසු 2025 මාර්තු 05 දින ප්‍රකාශයට පත් කර තිබුණි.	ඉදිරියේදී පියවර ගනු ලබන බව දන්වා තිබුණි.	පනත ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත දින හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතු වීම.

4.2 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව සතුව වාහන තුනක් පැවතියද, රියැදුරු තනතුරු 2ක් පුරප්පාඩු වීමෙන් වාහන දෙකක් නිශ්කාර්යව පවතින අතර ඒ හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමේ ප්‍රමාදයක් පැවතුණි.	පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කර ඇති බව දන්වා තිබුණි.	පුරප්පාඩු වී ඇති රියදුරු තනතුරු කඩිනමින් සම්පූර්ණ කර අදාළ වාහන භාවිතයට ගත යුතු වීම.

4.3 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වසර 20කට අධික කාලයක් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා භාවිතා කර තිබුණු නාවලර් සංස්කෘතික මධ්‍යස්ථානය සහ කුරුකුලම් ආනපන්දි උපකාර්යාලය පිහිටා ඇති ගොඩනැඟිලි සහ ඊට අදාළ භූමිය යාපනය මහ නගර සභාවෙන් දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබුණු අතර ඊට අදාළව යාපනය මහාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි.	අදහස් දක්වා නොතිබුණි.	දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් හින්දු කෝවිල් 183ක් සඳහා රු.මිලියන 33ක මූල්‍යාධාර ලබා දී තිබුණද, ඒ සඳහා කෝවිල් තෝරා ගැනීම, ලබාදෙන ආධාර මුදල් ප්‍රමාණය හා ප්‍රමුඛතාව යනාදියට අදාළ නිර්ණායක හඳුනාගෙන අනුමත කර ගනු ලැබූ විධිමත් ක්‍රමවේදයක් නොතිබුණු අතර ආධාර ලබා දීමෙන් පසු අදාළ ඉදි කිරීම හෝ නවීකරණය සම්බන්ධව පසු විපරම් කිරීම ද දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බව විගණනයට නිරීක්ෂණය නොවීය.	නිර්ණායක කලින් කලට වෙනස් වන බවත්, ප්‍රමුඛතාව මත මූල්‍යාධාර ලබා දෙන බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මූල්‍යාධාර ලබා දෙන බැවින් එම කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් (හින්දු/සංස්කෘතික) හා තාක්ෂණික නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා තොරතුරු ලබා දෙන බවත් දන්වා තිබුණි.	මූල්‍යාධාර ලබා දීම සඳහා නිශ්චිත නිර්ණායක සහ විධිමත් ක්‍රමවේදයක් අනුමත කර ගනු ලැබිය යුතු වීම හා ඒ සම්බන්ධයෙන් පසු විපරම් කළ යුතු වීම.

5. යහපාලනය

5.1 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01/2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු	2024 වර්ෂයේදී රැස්වීම් දෙකක් පැවැත්වූ බවත්, ඉදිරියේදී, කාර්තුමය වශයෙන් රැස්වීම් පැවැත්වීමට පියවර ගනු ලබන බවත් දන්වා තිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක්

රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ තෙවැනි කාර්තුවේ එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තු රැස්වීම 2025 පෙබරවාරි 18 දින පවත්වා තිබුණි.

පැවැත්විය යුතු වීම.